# චතුෂ්කෝටික තර්කයෙන් බෞද්ධ යථාර්ථය පිළිබිඹු වේ ද ?

සමන්ත ඉලංගකෝන්

## අරමුණ

භාරතීය ඥාන විභාගයේ මෙන්ම භාරතීය තර්ක ශාස්ත්‍රයේ ද අනන්‍යතාවය ප්‍රකට කෙරෙන චතුෂ්කෝටික තර්කය පෙරපර දෙදිග තර්ක ශාස්ත්‍රඥයින් ගේ සහ දාර්ශනික විචාරකයන් ගේ නොමඳ අවධානය ට සහ විචාරශීලිය ට යොමු ව තිබේ. පැරණි භාරතීය ආගමික ශාස්තෘවරුන් හා දාර්ශනිකයන් සිය ආගමික හා දාර්ශනික ප්‍රස්තුත විග්‍රහ කිරීමේදී භාවිත කළ චතුෂ්කෝටික ප්‍රස්තුත ගැන බෞද්ධ පෙළ පොත් වල එන විස්තර අනිකුත් මූලාශ්‍රයන් අභිබවා සිටී. චතුෂ්කෝටික ප්‍රස්තුත වල තෙවැනි හා සිවුවන ප්‍රකාශන සම්බන්ධයෙන් උද්ගත වූ ගැටලුදායක තත්ත්වයන් සමහරු චතුෂ්කෝටිය අපෝහක ක්‍රමයක් ලෙස ද විවරණය කෙරෙති. එනම් මුල් ප්‍රකාශනයේ සිට සිවුවැනි ප්‍රකාශනය තෙක් ගමන් කිරීමේදී ක්‍රමික ව පරමාර්ථ සත්‍යය කරා ගමන් කරන බව යි. ඒ අනුව සිවුවැනි ප්‍රස්තුතය කිසියම් දෙයක් සම්බන්ධයෙන් පවතින ඉහළම යථාර්ථය විශද කරන බව එකල භාරතයේ සිටි සමහර දාර්ශනිකයන් ගේ ද අදහස වූ බව මූලාශ්‍රයන් ගෙන් හෙළි වන කරුණ කි.

චතුෂ්කෝටික ප්‍රකාශනයන් ගැන තොරතුරු බෞද්ධ පෙළ පොත් වල සඳහන් වුවද එය බුද්ධ දේශනාවක් ලෙස හැඳිනීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි නොමැත. එහෙත් ඇතැම් අවස්ථා වල බුදුරජාණන් වහන්සේ චතුෂ්කෝටික ප්‍රකාශන ඇතැම් ධර්ම කරුණු පැහැදිලි කිරීමේදී භාවිත කොට තිබෙන නිසා එය "බෞද්ධ චතුෂ්කෝටිය" වශයෙන් දැක්වූ අවස්ථා ද